# තත්ත්ව ප්‍රතිපත්තිය

ටීජේ ලංකා ආයතනයෙහි, අප විසින් නිෂ්පාදනය කොට ගැනුම්කරුවන් වෙත ලබාදෙන රෙදිපිළි, ගැනුම්කරුවන්ගේ අපේක්ෂාවන් හා අවශ්‍යතාවයන් සපුරාලන තත්ත්ව ප්‍රමිතීන්ගෙන් සමන්විත වන බැව් සහතික කිරීමට බැඳී සිටිමු.

අප විසින් ක්‍රියාවෙහි යොදවා ඇති ක්‍රියාවලීන් හා තත්ත්ව කළමනාකරණ පද්ධතීන් නිරන්තරයෙන් වැඩිදියුණු කිරීමටත්, ආයතනයේ සන්දර්භයට අනුකූල වෙමින් ආයතනය සමග සම්බන්ධ සියලුදෙනාගේම අපේක්ෂාවන් සාක්ෂාත් කරගැනීමටත් කැපවී ක්‍රියාකරන්නෙමු.

ආයතනයේ සියලුම මට්ටම්වල සාමාජිකයින් විසින් මෙම තත්ත්ව ප්‍රතිපත්තිය මනාව අවබෝධ කොටගෙන තිබීමටත්, ඒ අනුව ක්‍රියාත්මක වීමටත්, නිසිලෙස පවත්වාගෙන යාමටත්, අවශ්‍ය අවස්ථාවන්හිදී විමර්ශණය කිරීම මගින් එහි යෝග්‍යතාවය ඇගයීමටත් සහතික වන්නෙමු.

*ප්‍රධාන විධායක නිලධාරී - පුබුදු ද සිල්වා*

2020 පෙබරවාරි 05